උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන නිලධාරී - III

ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පවතින සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2021.06.30 දින වේ. මෙම තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2021 අගෝස්තු මස අනුරාධපුර නගරයේදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. පුරප්පාඩු සංඛ්‍යාව

බඳවා ගැනීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව 13 කි. බඳවා ගන්නා අවස්ථාවේදී සේවා අවශ්‍යතාවය මත පුරප්පාඩු සංඛ්‍යාව තීරණය කිරීමේ අයිතිය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

02. පොදු සුදුසුකම් :

i. මනා සොබාව හස්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

ii. 2011.06.30 දිනට වයස අවු. 18 - 30 අතර විය යුතුය. රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

iii. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න අවු. 03 ක් අඛණ්ඩව උතුරු මැද පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

iv. සෑම අපේක්ෂකයෙකුම උතුරු මැද පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

v. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 අනුව දිස්ත්‍රික් ජන අනුපාතය පදනම් කර ගනිමින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

03. අධ්‍යාපන සුදුසුකම් :

(අ) සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ වෙනත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව, එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. **සහ**

(ආ) ආර්ථික විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය, ගණකාධිකරණය, ව්‍යාපාර සංඛ්‍යානය, ව්‍යාපාර අධ්‍යයනය, භූගෝල විද්‍යාව, දේශපාලන විද්‍යාව, තොරතුරු තාක්ෂණය, රසායන විද්‍යාව භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයක් හෝ ඇතුලුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත් වී තිබීම ප්‍රමාණවත් වේ.)

04. වෘත්තීය සුදුසුකම් :

i. ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ උසස් ගණකාධිකරණ හෝ විගණන කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමත්ව තිබීම. **හෝ**

ii. ගණකාධිකරණ ශිල්පිය ආයතනයේ (AAT) අවසාන අදියර සමත් වී තිබීම හෝ ඊට සමාන සුදුසුකම් ලබා තිබීම. **හෝ**

iii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් රජයේ හෝ රජයේ අනුමැතිය හෝ පෞද්ගලික ආයතනයක පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය, ගණකාධිකරණය හෝ වාණිජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත් වී තිබීම.

හෝ

iv. කාර්මික විද්‍යාලයේ හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත් වී තිබීම.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ඉහත 02, 03, 04 ඡේදයන්හි සඳහන් සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.

05. තනතුරට අදාළ වැටුප් ක්‍රමය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MN3-2016 අනුව රු. 31,040-10X445-11X660-10X730-10X750-57,550/- (මාසික) වැටුප් පරිමාණයක් හිමිවන අතර, අනුමත ජීවන වියදම් දීමනාව රු. 7800/- හා රජය විසින් අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.

06. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි

(අ) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් විටින් විට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට පත්වීම්ලාභින් යටත් විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් ඔහුගේ පත්වීම එක් අවුරුදු වැඩබැලීමේ කාලයකට යටත් වේ. අනෙකුත් නිලධාරීන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.

(ආ) බඳවා ගන්නා නිලධාරීන් උතුරු මැද පළාත් සභා බල ප්‍රදේශය තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 ට අනුව හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර තුනක් (03) ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

අයදුම්කරුවන් අතුරින් ඉහත 02, 03, 04 ඡේදයන්හි සුදුසුකම් සපුරා ඇති අය පමණක් ලිඛිත විභාගයකට භාජනය කිරීමෙන් අනතුරුව ලිඛිත විභාගයේ ලකුණු කුසලතාවයේ අනුපිළිවෙළ අනුව, උපරිම ලකුණු ලැබූ අය අතුරින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව තෝරා ගැනීම සිදු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමක් සිදුකරනු නොලැබේ. සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් අරමුණ වේ.

(i) තරග විභාගයේ (ලිඛිත) විෂයයන් හා විෂය නිර්දේශයන්

විෂය අංක - 1 බුද්ධි පරීක්ෂණය (ලකුණු 100 යි කාලය පැය 01 යි)

අපේක්ෂකයන්ගේ සිතීමේ තර්කානුකූලභාවය, විශ්ලේෂණ හැකියාව, තීරණ ගැනීමේ හැකියාව ද විනිශ්චය කිරීම සඳහා බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 50 කින් සමන්විත වූ ප්‍රශ්න පත්‍රයකි. සමත්වීම සඳහා ලකුණු 40 ක් ලබාගත යුතුය.

විෂය අංක - 2 සාමාන්‍ය දැනීම (ලකුණු 100 යි කාලය පැය 01 යි)

අපේක්ෂකයන්ගේ

(අ) ජාතික හා ජාත්‍යන්තර සමාජ, ආර්ථික හා දේශපාලන දැනුම

(ආ) සමුපකාර දර්ශනය හා ව්‍යාපාර පිළිබඳ දැනුම මැන බැලීම සඳහා වන, බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 50 කින් සමන්විත වූ ප්‍රශ්න පත්‍රයකි. සමත්වීම සඳහා ලකුණු 40 ක් ලබාගත යුතුය.

08. අයදුම්පත් යොමු කිරීම :

(අ) මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව ඒ 4 ප්‍රමාණයේ (සෙ.මී. 21X29) කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කර ගත යුතුය. අංක 01 සිට 10 දක්වා කරුණු පළමුවන පිටුවේවද, අංක 11 සිට 14 දක්වා කරුණු දෙවන පිටුවටද අනෙක් කරුණු ඉතිරි පිටුවටද වනසේ සකස් කළ යුතුය.

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත 2021.06.30 වැනි දිනට හෝ ඊට පෙර 9"X4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ප්‍රයෝජනයට ගනිමින් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය, උතුරු මැද පළාත, අනුරාධපුර"** යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීම - 2021"** (______ දිස්ත්‍රික්කය) යන්න සහ අයදුම් කරනු ලබන දිස්ත්‍රික්කය ද පැහැදිලිව ලිවිය යුතුය.

(ඇ) අයදුම්පත්‍රය සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙනි. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ඈ) මූලික සුදුසුකම් සපුරා නොමැති, ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන, විභාග ගාස්තු ගෙවා නොමැති, අපැහැදිලි අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒ බව දන්වා යවනු නොලැබේ.

(ඉ) අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් බොරුබව හෝ අසත්‍ය බව කර ගැනීමෙන් පසුව සේවයේ යෙදී සිටියදී වුවද ඕනෑම අවස්ථාවක අසත්‍ය බව සනාථ වුවහොත් හෝ ඔහු/ ඇය සේවයෙන් පහ කිරීමට යටත්වනු ඇත.

09. විභාග ගාස්තු

විභාග ගාස්තු වශයෙන් රු. 600.00 ක මුදලක් උතුරු මැද පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් උතුරු මැද පළාත් සභාවේ ආදායම් ශීර්ෂ 2003.02.13 ගිණුමට බැර වන ලෙස ගෙවා නිකුත් කරන NC100 කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මෙම විභාග ගාස්තු කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලබන අතර, ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ. එසේම මුදල් ඇණවුම් හා මුද්දර ගාස්තු භාරගනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10. අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම.

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

11. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළයුතු අතර, විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය පමණි.

12. මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමේ බලය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. මෙම දැන්වීමේ දෙමළ පරිවර්තනයෙහි අනනුකූලතාවයක් සම්බන්ධයෙන් සිංහල නිවේදනය බලපැවැත්වේ.

13. මෙම නිවේදනය මගින් අනාවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතියද කිසියම් පුරප්පාඩු වලින් කොටසක් හෝ මුළුමණින්ම හෝ පිරවීම පෙර නොපිරවීම හෝ පිළිබඳ අවසන් තීරණය ගැනීමේ අයිතියද උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේය.

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.
2021.05. 14

දුරකථන - 0252222773

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

ආදර්ශ අයදුම්පත්‍රය

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2021

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල - 2
දෙමළ -3

01. මුලකුරු අගට යොදු මුලකුරු සමග නම (සිංහලෙන් / දෙමළෙන්) : ______

මුලකුරු අගට යොදු මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (උදා. Sunil B.C) : ______

02. සම්පූර්ණ නම :
i. සිංහලෙන්/ දෙමළෙන් : ______
ii. ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : ______

03. ස්ථිර ලිපිනය :
i. සිංහලෙන් / දෙමළෙන් : ______
ii. ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : ______

04. දුරකථන අංකය :
i. ස්ථාවර : ______ ii. ජංගම : ______

05. ස්ථිර පදිංචිය :
i. පදිංචි දිස්ත්‍රික්කය : ______
ii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ______
iii. ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ අංකය : ______

06. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

07. ස්ත්‍රී/ පුරුෂ භාවය :

පුරුෂ	
ස්ත්‍රී	

(අදාළ කොටුව තුළ X සලකුණ යොදන්න)

08. උපන්දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

09. අයදුම්පත් කැඳවන අවසාන දිනට (2021.06.30) වයස අවු. ☐☐ මාස ☐☐ දින ☐☐

10. විවාහක/ අවිවාහක බව : ______

11. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර

අ.පො.ස. (සා. පෙළ) විභාගය (සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය)

11.1 විභාග වර්ෂය : ______ විභාග අංකය : ______

අනු අංකය	විෂයයන්	ලබා ඇති සාමාර්ථ	අනු අංකය	විෂයයන්	ලබා ඇති සාමාර්ථ
01			06		
02			07		
03			08		
04			09		
05			10		

අ.පො.ස (උ. පෙළ) විභාගය (සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය)

11.2 විභාග වර්ෂය : ______ විභාග අංකය : ______

අනු අංකය	විෂයයන්	ලබා ඇති සාමාර්ථ
01		
02		
03		
04		

12. වෘත්තීය සුදුසුකම් : (සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය)

වෘත්තීය සුදුසුකම්	ලබාගත් ආයතනය	ලියාපදිංචි අංකය	වලංගු වන දිනය	ලබා ඇති සාමාර්ථය

13. විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සිය පිළිබඳ විස්තර : ______
මුදල් ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම : ______
කුවිතාන්සි අංකය : ______
ගෙවූ දිනය : ______

මුදල් ගෙවූ කුවිතාන්සිය මෙහි නොගැලවෙන සේ අලවන්න

(කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගන්න)

14. අයදුම්කරුගේ සහතිකය

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය පිළිබඳ වන කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත්, විභාගයට පෙර හෝ පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත් තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

දිනය : ______

______
අත්සන් සහතික කරන නිලධාරියාගේ අත්සන

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ______ මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම කුවිතාන්සිය අලවා ඇති බවත්, ඔහු/ ඇය ______ වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

දිනය : ______

______
අත්සන් සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :
තනතුර :
ලිපිනය :

(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවෙකුට නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතුය)

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ______ මයා/ මිය/ මෙනවිය ______ කාර්යාලයේ / ආයතනයේ ______ දින සිට ______ තනතුරක සේවය කරන බවත්, ඔහුගේ/ ඇයගේ සේවය සතුටුදායක බවත්, මෙම විභාගයෙන් ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරන බවත්/ නොකරන බවත්, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් සහතික කරමි.

______
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :
තනතුර : ______
ලිපිනය : ______
දිනය : ______

Source: Dinamina, Daily News (2021.05.21)